**පළාත් පාලන අමාත්‍යවරයාගේ අංක 2296/05 හා 2022 සැප්තැම්බර් 06 දිනැති ගැසට් නිවේදනයේ පරිදි විසුරුවා හරින ලද කෑගල්ල නගර සභාව - 2023 මාර්තු 19 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා**

---

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නගර සභා ආඥාපනතේ ( 255අධිකාරිය) 14වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයාගේ අංක 2296/ 05 හා 2022 සැප්තැම්බර් 06 දිනැති ගැසට් නිවේදනයේ පරිදි විසුරුවාහරින ලද කෑගල්ල නගර සභාවේ 2023 මාර්තු 19 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එදිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2023 මාර්තු 19 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ 2023 මාර්තු 19 දිනට ඇවර කිරීමේ ගිණුම නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 මාර්තු 19 දිනට කෑගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍යවන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශවීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඇති ජර්නල් සටහන් අත්සන් යොදා අනුමත කර නොතිබුණි | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සෑම ජර්නල් සටහනක්ම අනුමත කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උසාවි දඩ මුදල් ආදායම රු.110,500 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතය. |
| (ආ) | 2023 මාර්තු 19 දිනතෙක් මාර්තු මාසය සඳහා ගෙවිය යුතු සභික දීමනා රු.436,670 ක් ද කාර්ය මණ්ඩල වැටුප් රු 4,099,042 ක් ද වියදම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු 33,176,830 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඈ) | 2023 මාර්තු 19 දිනට ලැබිය යුතු සතිපොළ දඩ රු.104,922 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඉ) | 2017 සිට 2022 දක්වා නගරශාලාව වෙන්කිරීම සඳහා ලැබුණු රු.2,466,022 ක් හා විනෝද බදු වෙනුවෙන් ලැබුණු රු5,546,398 ක් ඒ ඒ වර්ෂ වල ආදායමට ගැනීමට කටයුතු නොකිරීම නිසා එම ප්‍රමාණයෙන් සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත කාල පරිච්ඡේදයේ නගර ශාලාව වෙන්කිරීම් වෙනුවෙන් ලැබී තිබූ රු.645,000 ක් හා විනෝද බදු තැන්පත් රු. 1,320,000 ක් ආදායමට නොගැනීම නිසා එම වටිනාකම් වලින් ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (උ) | ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රු. 348,931 ක විදුලි අංශයේ තොගය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | - එම - |
| (ඌ) | විවිධ විෂයයන් 04 ක් වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු.1,594,518 ක මුදලක් ආදායමට නොගෙන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබීම නිසා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |

### 1.6.3 නොසැසඳුණු පාලන ගිණුම්

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත කාලපරිච්ඡේදය අවසානයට ගිණුම් විෂයයන් 10 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ, උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.692,006 ක වෙනසක් පැවැතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | උපයෝගී ලේඛන ගිනුම් ශේෂ සමඟ සසඳා නිවැරදි කල යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. මුදල් රෙගුලාසි 373 | සියලුම අග්‍රිම දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත් 2013 ජූලි 08 දින ලබා දී තිබූ රු.25,920 ක් වූ අත්තිකාරම් 2023 මාර්තු 19 දින වන විටත් පියවා නොතිබුණි. | පියවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. මුදල් රෙගුලාසි 571 | එකතුව රු.9,871,826 ක කල් ඉකුත් වූ තැන්පතු 211 ක් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | - එම - |
| (ආ) අංක 05/2018(1) හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.3 ඡේදය | පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය අධීක්ෂණය හා ඇගයීමට සභාව විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) අංක02/2020 හා 2020 අගෝස්තු 2 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සභාව විසින් ඉටුකල යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළහැකි කාර්ය සාධක දර්ශක තුනක් හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) පළාත් පාලන චක්‍රලේඛ | | | |
| i. 2018 ජුලි 19 දිනැති අංක 2018/e පළාත් පාලන අංක 01 දරන චක්‍රලේඛය | අන්තර්ජාලය හරහා ගෙවීම් කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා නොතිබුණු අතර ජනතාහිතවාදී සේවාවක් ලබා දීම සඳහා හා පොදු කාර්යාල පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් හඳුන්වාදී නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු ය. |
| ii. 1988 මැයි 17 දිනැති අංක 1988 /22 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | වරිපනම් අය කිරීම සඳහා වර්ෂ 05 කට වරක් දේපල තක්සේරුව කළයුතු වුවද 2000 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් බදු අයකර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දේපල තක්සේරුව සිදුකරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 මාර්තු 19 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,837,390 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත්කළ තොරතුරු අනුව සමාලෝචිත කාලපරිච්ඡේදයට අදාලව බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | බිල්කල ආදායම | රැස්කළ ආදායම | මුළු හිගය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,145,207 | 3,865,882 | 5,041,024 |
| කුලී | 16,881,315 | 15,470,060 | 7,753,337 |
| බලපත්‍ර ගාස්තු | 986,878 | 513,308 | 573,800 |
| වෙනත් ආදායම් | 17,623,991 | 21,703,322 | 27,077,277 |
| එකතුව | 38,637,391 | 41,552,572 | 40,445,438 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු<br>සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාලව ලබා දී තිබුණු තොරතුරු අනුව අයවිය යුතු හිඟ වරිපනම් බදු ශේෂය රු. 5,041,024 ක් විය. වරිපනම් සඳහා භාවිතා කරන මෘදුකාංගය අනුව හිඟ වරිපනම් සඳහා අය කරන දඩ හා කාල විශ්ලේෂණය ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී සුදුසු පරිගණක මෘදුකාංගයක ලබාගන්නා බව. | හිඟ බදු මුදල් අයකර ගත යුතු අතර දඩ හා කාල විශ්ලේෂණය පිළිබඳ තොරතුරු ලබාගත යුතුය. |
| (ආ) | කුලී | | |
| (i) | සමාලෝචිත කාලපරිච්ඡේදය අවසානයට අයවිය යුතු හිඟ කඩකුලී ශේෂය රු.3,020,658 ක් වූ අතර වසර 01 ත් 05 ත් අතර අයවිය යුතු ශේෂය රු.448,300 ක් හා වසර 05 ඉකුත් වූ ශේෂය රු.765,110 ක් විය. | ඡේදයට අදාලව අදහස් දැක්වීම් ඉදිරිපත් කර නැත. | හිඟ කඩකුලී ආදායම් අයකර ගත යුතුය. |
| (ii) | කාලපරිච්ඡේදය අවසානයට අයවිය යුතු කඩකුලී දඩ ශේෂය රු.2,348,068 ක් වූ අතර වසර 05 ඉකුත් වූ ශේෂය රු.2,055,364 ක් විය. | මේ වන විට රු.226,729 ක් අයකරගෙන ඇත. ඉතිරි ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ කඩකුලී දඩ අයකර ගත යුතුය. |
| (iii) | තානායම් කුලී අයවිය යුතු ශේෂය රු.2,474,645 ක් වූ අතර ඒතුළ වසර 01 ත් 03 ත් අතර රු.1,110,200 ක් හා වසර 05 ට වැඩි ශේෂය රු.502,026 ක් විය. | ගෙවීම් කරන ලෙස බදුකරුට දැනුම්දී ඇති බව. | හිඟ කුලී අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ඔක්තෝබර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 ප්‍රකාරව වසර 11 කට වැඩි කාලයක සිට ධාවන තත්ත්වයේ නොපවතින වාහන 04 ක් සම්බන්ධයෙන් අපහරණය කිරීම හෝ අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අපහරණ කටයුතු සිදු කරමින් පවතින බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | වර්ෂ 02 ක සිට වර්ෂ 04 මාස 03 දක්වා කාල සීමාවක් තුළ වාහන 03 ක් ධාවනයේ යොදවා නොතිබූ බැවින් ඌන උපයෝජිතව පැවතුණි. | HS-1729 බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කටයුතු සඳහා යොමුකර ඇති බව. | වත්කම් ඌන උපයෝජිතව නොතැබිය යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 මාර්තු 19 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහාවූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සහ 2023 මාර්තු 19 දිනට ඇවර ගිණුම විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2024 අගෝස්තු 06 දිනදීය. | 2023 ජනවාරි 01 දින සිට 2023 මාර්තු 19 දින තෙක් නගර සභාවට අදාලව ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස 2024 මැයි 22 දින දැණුවත් කරන ලදි. ඒ අනුව අදාල ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කර ඇති බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 4.2 විගණන කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාව විසින් 2023 මාර්තු 19 දිනට 2023 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණු අතර 2022 වර්ෂයට එක් වරක් පමණක් කමිටු රැස්වීමක් පවත්වා තිබුණි. | ඉදිරියේදී කාර්තු පදනමින් විගණන කමිටු පැවැත්වීමට සැලසුම් කර ඇති බව. | පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2/2018/14 හා 2018 ඔක්තෝබර් 19 දිනැති උපදෙස් චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුය. |

**4.3** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නගර සභාවේ 2023 මාර්තු 19 දිනට අදාල කාලපරිච්ඡේදය වෙනුවෙන් අභ්‍යන්තර විගණන විමසුම් නිකුත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන විමසුම් ඉදිරිපත් කර නොමැති බව. | අභ්‍යන්තර විගණනයන් සිදු කර විමසුම් නිකුත් කල යුතුය. |